# ජ.වි.පෙ. ආණ්ඩුවට එන්න සූදානම් උනේ මේ රටේ අලුත් ආණ්ඩුවක් හදන්න

ජ.වි.පෙ. කලුතර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී
**පියසිරි විජේනායක**



පසුගියදා ඕස්ට්‍රේලියාවේ පාර්ලිමේන්තු කටයුතු පිළිබඳව අධ්‍යනය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුව නියෝජනය කරමින් ඊට එක් වූ සමස්ත ලංකා වෘත්තීය සමිති සම්මේලනයේ සභාපති සහ ජ.වි.පෙ. කලුතර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී පියසිරි විජේනායක සමඟ ශ්‍රී ලංකාවේ වර්තමාන දේශපාලන තත්ත්වය පිළිබඳව සන්නස පැවැත්වූ සාකච්ඡාව :-

***ජනතා විමුක්ති පෙරමුණ මහින්ද රාජපක්ෂ ආණ්ඩුවට එකතු නොවීමෙන් එක්සත් ජාතික පක්ෂය එකතු කර ගැනීමට සිදුවුණා නේද?***

ඔබේ ප්‍රශ්නයට පිළිතුරු දීමට ප්‍රථමයෙන් එක්සත් ජාතික පක්ෂය ආණ්ඩුවට ආවා නොවෙයි. එක්සත් ජාතික පක්ෂයේ වංචා ප්‍රශ්න මෙන්ම, රට බෙදීමට එක් වූ අය මහින්ද රාජපක්ෂ ආණ්ඩුවට එකතු වුණා.
ජ.වි.පෙ. මහින්ද ආණ්ඩුවට එන්න දෙයක් නෑ. ජ.වි.පෙ. තමයි මහින්ද ආණ්ඩුව හැදුවේ. ජ.වි.පෙ. දිගටම මහින්ද ආණ්ඩුවේ කටයුතු වලට උදව් කළා. ඒ විතරක් නෙවෙයි, සන්ධාන ආණ්ඩුව හදලා අවුරුදු 03ක් වෙන්න එනවා. මෙච්චර කල් මේ ආණ්ඩුවට උදව් කළේ, ආරක්ෂා කළේ එක්සත් ජාතිකපක්ෂයේ ඔය ආපු අයද කියන එකයි මම අහන්නේ.
මහින්ද ආණ්ඩුව හදපු දවසේ ඉඳලා කව්ද ආණ්ඩුවට උදව් කළේ. ජනතා විමුක්ති පෙරමුණ. ඒ විතරක් නෙවෙයි, පාර්ලිමේන්තුවේ මොන පනතද පරාද වුණේ. හදිසි නීතිය පරාද උනාද? වෙනත් පනත් පරාද උනාද?
2006 / 2007 අය වැය දෙකම පරාද උනාද? නෑ. මේ අය-වැය සියල්ලටම අපි ඡන්දය දුන්නා. එහෙම නම් මොකක්ද වෙලා තියෙන්නේ. ජ.වි.පෙ. ආණ්ඩුවට එන්නම ඕනෑ මේ සියල්ල කර ගන්න. අපි උදව් කරන නමුත් ජ.වි.පෙ. කොයි විදියකින්වත් මහින්ද චින්තන ප්‍රතිපත්ති වලට පිටින් තිබෙන උවමනා ඉටුකරන්න දෙන්නේ නෑ.

***ඔබ කිව්වා ආණ්ඩුවට උදව් කරනවා කියලා. එහෙම නම්, ජ.වි.පෙ. ආණ්ඩුවට එන්න යෝජනා 20 ක් ඉදිරිපත් කළා නේද?***

මේක වැදගත් ප්‍රශ්නයක්. මොකද ජ.වි.පෙ. ආණ්ඩුවට එන්න සූදානම් උනේ මේ රටේ අලුත් ආණ්ඩුවක් හදන්න. එය මෙතෙක් තිබුණු ආණ්ඩුවලට වඩා වෙනස් රැඩිකල් ආණ්ඩුවක්. මෙතෙක් තිබුණ ප්‍රතිපත්ති සම්පූර්ණයෙන්ම වෙනස් කරලා අලුත් ගමනක් යන්න හදපු ආණ්ඩුවක්. ඒක නිසා අපි යෝජනා 20 ක් දුන්නා. ඒ යෝජනා අතර වැදගත් වු යෝජනා කීපයක් ආණ්ඩුව ඉටු කිරීමට එකඟ වුණේ නෑ.
අපි කිව්වා එල්.ටී.ටී.ඊ. එක්ක අත්සන් කරපු ගිවිසුම වහාම අවසන් කරලා දමන්න කියලා. මොකද ආණ්ඩුව කිව්වා ඒක කරන්න බෑ කියලා. නෝර්වේ නියෝජිතයින් රටට කරන බලපෑම ස්වෛරී රාජ්‍යයක් ලෙසම තිබීමට බලපෑම් කිරීම නතර කරන ලෙස අපි ඉල්ලුවා. මෙම යෝජනා 02 නොමැතිව අපිට ආණ්ඩුවට යන්න බෑ. මේවා කරන්න බෑ කියන්නේ බොරු. රට බෙදීමට බෙදුම්වාදී උවමනාවට අත්සන් කරපු ගිවිසුම අයින් කරන්න ආණ්ඩුවට ඕන තරම් ඉඩ කඩ තිබුණා.
හමුදාපතිවරයාට පහර දුන්න වෙලාවේ, හබරන දී යුද හමුදාවේ 90ක් මරා දැමූ වෙලාව, ගෝඨාභය රාජපක්ෂ ආරක්ෂක ලේකම්ට බෝම්බ ගහපු වෙලාව, මේ හැම වෙලාවේම ආණ්ඩුව ඒක අමතක කරා. මේ එක වෙලාවකවත් තමන්ගේ වගකීම ආණ්ඩුව ඉටු කළේ නෑ. නෝර්වේ ආණ්ඩුව රටේ අභ්‍යන්තර කටයුතු වලට මැදිහත් වීම වහාම නතර කරන්න කියලා අපි කිව්වා. ඕක කරන්න බැරි නම් අපිට අලුත් ආණ්ඩුවක් හදන්න බෑ. හැබැයි, මහින්ද ආණ්ඩුව කැබිනට් මණ්ඩල 30 කට සීමා කරන එකටත් විරුද්ධ උනා. දැන් ඇමති මණ්ඩලය 107 ක් වෙලා තියෙනවා. කොහොමද ආණ්ඩුව ඇතුළට යන්නේ.

*<u>අපිට මහින්ද ආණ්ඩුව වට්ටන්න අවශ්‍ය නෑ. මොකද අපේ රටේ ජනතාව වඩාත් විශ්වාස කලේ ජ.වි.පෙ. ගැනයි. මොකද මහා මැතිවරණයේදී වැඩිම මනාප දුන්නේ ජ.වි.පෙ. නියෝජිතයින්ට.</u>*

***දැන් ජ.වි.පෙ. මහින්ද ආණ්ඩුව වට්ටන්න හදනවාද?***

අපොයි නෑ, අපිට මහින්ද ආණ්ඩුව වට්ටන්න අවශ්‍ය නෑ. මොකද අපේ රටේ ජනතාව වඩාත් විශ්වාස කලේ ජ.වි.පෙ. ගැනයි. මොකද මහා මැතිවරණයේදී වැඩිම මනාප දුන්නේ ජ.වි.පෙ. නියෝජිතයින්ට. ඒ මොකද මෙරට නිසිමග ගෙනයෑම ජනතා විමුක්ති පෙරමුණ වෙත පැවැරුවා. ශ්‍රී.ල.නි.ප. කෙරේ නෙවෙයි විශ්වාසය තැබුවේ. ඒක නිසා අපි කියන්නේ ආණ්ඩුව ජනතා උවමනාව දෙසට හැරවීමට අපි උත්සාහ කරනවා. මහින්ද රාජපක්ෂ ආණ්ඩුව ජ.වි.පෙ. අත්හැරලා යූ.එන්.පී. වංචා දූෂණ වලට සම්බන්ධ හොර නඩයක් සමග ගමනක් ආරම්භ කරලා තියෙන්නේ නිකම්ම නෙවෙයි. ජ.වි.පෙ. සමග කරන්න බැරි දේ ඉටු කර ගන්න.

*<u>සන්ධාන ආණ්ඩුව හදලා අවුරුදු 03ක් වෙන්න එනවා. මෙච්චර කල් මේ ආණ්ඩුවට උදව් කළේ, ආරක්ෂා කළේ එක්සත් ජාතික පක්ෂයේ ඔය ආපු අයද ?</u>*

***ඔබ ඒ කියන්නේ මහින්ද ආණ්ඩුව රට බෙදීමට උත්සාහ ගන්නවා කියලද?***

ඔව් ඒක තමයි අපිට තියෙන ප්‍රශ්නය. මොකද ආණ්ඩුව පෙන්නන මුහුණ නෙවෙයි තියෙන්නේ. හොඳම උදාහරණය තමයි සර්ව පාක්ෂික කමිටු යෝජනා මහින්ද ආණ්ඩුවේ ඇමති තිස්ස විතාරණ මහතා ඉදිරිපත් කරපු ලියවිල්ල රටේ උතුරු - නැගෙනහිර විතරක් නෙවෙයි, අනෙක් පළාත්වලත් ජාතිකත්ව පදනම, කතා කරන භාෂාව අනුව රට බෙදන්න උත්සාහ ගෙන තියෙනවා. ඒක තමයි බරපතල වැරැද්ද.
ඔන්න, ඔබට මම හොඳම උදාහරණයක් කියන්නම්, නිමල් සිරිපාල ද සිල්වා අපේ රටේ සෞඛ්‍ය ඇමතිවරයා. 2007 මාර්තු 02 සිඩ්නි නගරයේ ශ්‍රී ලාංකිකයින් අමතන වෙලාවේදී පැහැදිලිව කියා තියෙනවා ෆෙඩරල් ආණ්ඩුව හදන යෝජනාව පාර්ලිමේන්තුවේ සම්මත කරනවා කියලා. දැන් ඔබට ගමන පැහැදිලි ඇතිනේ. දැන් ජ.වි.පෙ.. කියනවා ලංකාවේ මහින්ද ආණ්ඩුව ජනවරමට පිටුපාලා අලුත් ගමනක් යන්න හදනවා කියලා.

***මහින්ද ආණ්ඩුව ජනවරමට පිටුපානවා කියලා කොහොමද කියන්නේ?***

අපි පැහැදිලිව කියනවා ජනවරම දුන්නේ මහින්ද චින්තනයට. මහින්ද චින්තනය තුළ ඒකීය රාජ්‍යයක් තියෙන්නේ. ඒකීය රාජ්‍යය වෙනුවට ෆෙඩරල් ගෙන්න හදනවා නම් එය ජනවරමට පිටුපෑමක්. ඒක පිළිගන්නවාද? එහෙම නම් මොකද කියන්නේ? මේ ආණ්ඩුව යන ගමන ගැන අපිට සැකයි. අනෙක් පැත්තෙන් රාජ්‍ය දේපල විකුනන්න අර අදිනවා. එහෙම නම් අපි අපේ වගකීම ඉටු කරන්න ඕනේ. ඒ සඳහා වඩාත් හොඳින් ජ.වි.පෙ. ජනතාව සංවිධානය කරනවා. අපි රටේ ජනතාවට කියනවා රට බෙදන එකට මහින්ද ආණ්ඩුව කටයුතු කරනවා නම් ඒකට විරුද්ධව අපි ක්‍රියා කරනවා.

***මහින්ද ආණ්ඩුව රට බෙදීමේ යෝජනා ගෙනාවොත් එය පරාද කරන්න සූදානම් වෙන්නේ කොහොමද?***

ඒක අපි විතරක් නෙවෙයි, රටේම ජනතාවගේ වගකීමක්. මහින්ද චින්තනය දිනවපු කාගේත් වගකීමක්. ඒ වගකීම ඉටු කරන්න අපි ජනතාවට කියනවා. ඒ නිසා ජ.වි.පෙ. විදියට කියනවා අපේ රටේ වැඩකරන ජනතාව, ගොවි ජනතාව, බුද්ධිමතුන්, ව්‍යාපාරිකයින් මෙන්ම ප්‍රගතිශීලී බලවේගය එකතු කර ගෙන බෙදුම් වාදය පරදවන්න අපි එකතු වෙනවා.

***නන්දන ගුණතිලක සහෝදරයා ජනතා විමුක්ති පෙරමුණෙන් ඉවත් වෙලා නේද?***

මේක දීර්ඝව සාකච්ඡා කරන්න ගැටලුවක් නෙවෙයි. ජ.වි.පෙ. ප්‍රතිපත්තිවලට විරුද්ධව විනය විරෝධීව කටයුතු කරන ඕනෑම කෙනෙක් පක්ෂයෙන් ඉවත් කරනවා. වෙන මොනවත් ඒ පිළිබඳව කියන්න නෑ.

## සුභාෂිතයෙන්

පසක් මුනිඳු සමයමස නොගෙන සුනිමල
අනෙක් කුදිටු ගෙන ලෝ සත නැන විකල
එමොක් පුරට පැමිනෙන යම් කල එකල
අඳෙක් දැක්ක ගෙය් මින් පදද නුබ තල

පසක් සුනිමල මුනිඳු සමයම නොගෙන නැත විකල ලෝ සත් අනෙක් කුදිපු ගෙන ඒ මොක්පුරට යම් කල පැමිනෙන, එකල අඳෙක් නුබ තලමින් පදද දැක්ක හෙය්,

පසක් - ප්‍රත්‍යක්ස (නිරවුල්) වූ සුනිමල - ඉතා පිරිසිදු වූ. මුනිඳු සමයම - බුද්ධාගම පමනක් නොගෙන - නොපිලිගෙන, නැන විකල් ලෝ සත - මොලේ / සිහිය නරක් වූ මිනිසුන්ටත්, අනෙක් කුදිටු ගෙන - වෙනත් වැරදි ආගම් / අදහම් වැළඳ ගෙන, ඒ මොක් පුරවර ඒ, මෝක්ස පුරයට යම්කල පැමිණෙන - යම් දවසක පැමිනිය හැකි නම්, එකල - එදාට, අඳෙක් - අන්ද යකුට, නුබ කල - අහසේ, මින් පද ද - මසුන්ගේ පාදද (පා සටහන් ද) දැක්ක හෙය්. අදහස තේරුම් ගැනීමේ පහසුව සලකා උක්තානුක්ත සම්බන්දයේ සුලු වෙනස් කමක් කරන්නට සිදුවූ බව සලකන්න.
''මිත්‍යාදෘෂ්ටි'' යන පද දෙකට එකට ගෙන ''මිසදිටු'' යනුවෙනුත් ''දෘෂ්ටි'' යන්න පමණක් ගෙන ''දුටු/දිටු'' යනුවෙනුත් වහරට ගත හැකිය. එහෙත් ''දිටු/දිටු'' යන්න තනිව යෙදෙන තැන් ඉතා දුර්වලයි. 'කු' උපසර්ගය එක් කොට 'කුදිටු' යන පදය වහරට ගෙන ඇත. කුදහම්/දුදහම් යනුවෙන් සරල/සුගම පදයක් වුවද හදා ගත හැකිය. 'කු' උපසර්ගයෙන් හොර/බොරු යන තේරුමත් 'දු' උපසර්ගයෙන් වැරදි/දුස්ට යන තේරුමත් ලැබේ.
'විකල' යන්න 'විකෘති' යන්නෙන් බිඳී ඇත්නම් එය ''විකළ' යනුවෙන් ලිවිය යුතුය. එහෙත් එය පත්පොත්වල ඇත්තේ ''විකල'' යනුවෙනි. ''විකල්'' යනුවෙන් හල් කරන තැන් ද දැක්ක හැකිය. ''විකාල'' ද ''විකල්'' ද විය හැකිය.
මෝක්ස පුරය යනු නිවනයි. මිසදිටු දහම් වැළඳ ගෙන නිවනට යා නොහැක. එසේ යත හැකි නම් අන්දයකුට අහසේ ඇති මසුන්ගේ පිය සටහන් ද දැක්ක හැකිය. අදහස නිරවුල් කර ගැනීම ඉතා දුස්කර කවියකි. උපමාවද අස්වාබාවිකය. මසුන්ට පාද නැත, පාද ඇති මසකු සිටියත් උෟට ගමන් බිමන් අහසේ කල නොහැක. එයද සිදු වුවත් අන්දයකුට ය දැකිය නොහැකිය. කවියා මෙයින් පවසන්නේ කුදිටුවකුට කිසිමදාක නිවන් නොදැකිය හැකි බවයි.

විකසිත

## Tsunami housing scheme in Madihe village, Matara,

(Funded by SPUR/SINHALA CULTURAL AND COMMUNITY SERVICES FOUNDATION/ COMBINED SCHOOLS/FRIENDS OF SRI LANKA/QLD & N.ZEALAND TEMPLES.

Tsunami Housing Project in Madihe, Matara, Funded by SPUR/SINHALA CULTURAL AND COMMUNITY SERVICES FOUNDATION/COMBINED SCHOOLS/FRIENDS OF SRI LANKA/QLD & N.ZEALAND TEMPLES has now been completed. The project completed 22 new houses and 6 semi- damaged houses.While the recipients constructed the houses under the supervision of the engineering division of RADA advised by the Pradeshiya National Housing Development Authority, the blueprints and the BOQs were as per the Government approved scheme. These houses which were contsructed in the recipients lands will be handed over to the owners at a ceremony on 7 March in the midst of distinguished invitees. SPUR President Dr. Dasarath Jayasuriya will represent donor Victorian organizations..

The project was co-coordinated by the Dharme Vijaya Foundation (DVF) in consultation with SPUR at every stage on behalf of the subject organizations who collected funds for this project. The construction was delayed due to Government housing policy decision in respect of distance from the shoreline.

Sri Lanka Disaster Fund ( member organizations as per above) remitted a sum of Rs 8,758,700- to DVF and including the interest earned (Rs 630,000) a total amount of Rs 9.388,700- was utilized for the project. On behalf of SLDF , SPUR wishes to convey grateful thanks to the Victorians who contributed to the housing project .